පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත.
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

| ශ්‍රේණිය |
| --- |
| 08 |

# දෙවන වාර පරීක්ෂණය - 2019
## සිංහල භාෂාව හා සාහිත්‍යය - I , II

පාසලේ නම : ..........................................................................................

ශිෂ්‍ය ශිෂ්‍යාවගේ නම / ඇතුළත්වීමේ අංකය : ....................................................
....................................................

කාලය : පැය **02** යි.

### I කොටස

- **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **අංක 1 සිට 20 තෙක් ප්‍රශ්නවල නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. මහාප්‍රාණ අක්ෂරයක් ඇතුළත් වරණය තෝරන්න.

1. සඤ්ඤක    2. පරිගණකය    3. ශිෂ්ටාචාරය    4. වර්ධනය

02. නිවැරදි අක්ෂර වින්‍යාසය යෙදී ඇති වචනය තෝරන්න.

1. ගනකාධිකාරි    2. කලමනාකරණය    3. රක්ෂණය    4. නිෂ්පාදණය

03. "ප්‍රධාන" යන වචනයෙහි අර්ථයක් නොවන්නේ,

1. මූලික    2. දානය    3. ප්‍රමුඛ    4. මුල් වූ

04. අකාරාදි පිළිවෙළ නිවැරදිව යෙදී ඇති වරණය වන්නේ,

1. කන්ද , කුන්ද , කොන්ද , කෙන්ද
2. අලි , කොටි , ඌරු , නරි
3. කහ , දම් , නිල් , රතු
4. නදීකා , නදීෂා , නයනා , නඳුන්

05. " බල සුබ නිමිති පෙර මඟ නැකතටත් වැඩි " යන කවි පදයෙහි සඳහන් විධි ක්‍රියා පදය තෝරන්න.

1. බල    2. සුබ    3. පෙරමඟ    4. නිමිති

- **පහත සඳහන් වාක්‍යවල හිස්තැනට ගැළපෙන පිළිතුර තෝරන්න.**

06. සියලු සතුරෝ , මිතුරෝ සුවපත් ..........................

1. වේවා !    2. වෙත්වා !    3. වෙමුවා !    4. වෙහිවා !

07. අපි විභාගයෙන් ඉහළ සාමර්ථ්‍ය .....................

1. ලබමුවා !    2. ලබත්වා !    3. ලැබේවා !    4. ලබහුවා !

08. "ඥානවන්ත" යන පදය අයත් නාම වර්ගය වන්නේ ,

1. තද්ධිත නාම    2. සමාස නාම    3. සංඥා නාම    4. සර්ව නාම

09. කරත්තයෙහි බැඳි , ගවයා වේගයෙන් දිව්වේ ය. මෙහි සඳහන් ක්‍රියා විශේෂණ පදයක් වන්නේ,

1. බැඳි    2. දිව්වේය    3. කරත්තයෙහි    4. වේගයෙන්

- මුලින් දී ඇති පදයට බහ්වර්ථ පදයක් නොවන්නේ,

10. දළ - 1. ජඨාව    2. ආසන්න    3. ලනුව    4. දත්

11. සත් - 1. ශාස්ත්‍රය    2. හක්ගෙඩිය    3. ඡත්‍රය    4. යහපත්

- **පහත දක්වා ඇති වාක්‍යවල හිස්තැනට සුදුසු පදය තෝරන්න.**

12. ................................ දහම් දෙසූහ.

1. නා හිමියන් 2. නා හිමියෝ 3. නා හිමි 4. නා හිමි විසින්

13. ................................ පොලිසියට හසු වූහ.

1. වරදකරුවා 2. වරදකරුවන් 3. වරදකරුවෝ 4. වරදකරුවෙක්

- **ඉරි ඇඳි පදවල නිවැරදි අර්ථය දැක්වෙන වරණය තෝරන්න.**

14. **<u>විලිකුන්</u>** සුරත් පල වැනි වේ රිවි මඬල '

1. වියළුණු 2. පරවුණු 3. ඉදුණු 4. වැටුණු

15. "**<u>පවර</u>** එ නිරිඳුගෙ පුත් කුමරා වෙමි"

1. ඉතා හොඳ 2. ඉතා නපුරු 3. ඉතා පහත් 4. ඉතා උතුම්

16. පහත දැක්වෙන පද අතරින් උක්ත පදය තෝරන්න.

1. මිනිසුන් 2. මුවන් 3. කාන්තාවක 4. දක්ෂයෝ

- **17 - 18 ප්‍රශ්නවල සඳහන් සාම්ප්‍රදායික යෙදුම් සඳහා වඩාත් ගැළපෙන අදහස තෝරන්න.**

17. කුකුළු නින්ද

1. කුකුළෙකු සේ නිදා ගැනීම
2. ස්වල්ප වේලාවක් නිදා ගැනීම
3. දිගු කාලයක් නිදා ගැනීම
4. නිෂ්ඵල ක්‍රියාවක යෙදීම

18. අන්තිම ඉත්තත් ඇදීම

1. දාන් ඇදීමට උත්සහ ගැනීම
2. කිසිදු සහයක් නොගැනීම.
3. අන්තිම උත්සාහයත් ගැනීම
4. කිසිදු උත්සහයක් නොගැනීම.

19. "රාත්‍රිය" පද්‍ය පන්තිය රචනා කරන ලද්දේ ,

1. මහගමසේකර මහතා
2. තොටගමුවේ ශ්‍රී රාහුල හිමි
3. ඇස්. මහින්ද හිමි
4. ලීල් ගුණසේකර මහතා

20. සිංහල ශබ්දකෝෂයේ සඳහන් 'දසන' යන පදයෙහි නිවැරදි අර්ථය වන්නේ ,

1. දන්තය 2. ඇස් 3. දසුන 4. දර්ශන

(ලකුණු 40)

# II කොටස

01. පහත සඳහන් මාතෘකාවලින් එකක් තෝරාගෙන වචන 200කට නොඅඩු වන සේ රචනාවක් ලියන්න.

i. ඉගෙනීමේ අගය.

ii. වන සම්පත රැක ගනිමු.

iii. රිය අනතුරු වළකමු.

iv. මගේ රට මට අගෙයි.

(ලකුණු 20 යි)

02. පහත ගද්‍ය , පද්‍ය පාඨ ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. " නෑ නෑ එසේ කරන්න එපා. ඇය පුළුවන් තරම් කාලයක් ඇගේ මෙහෙය ඉටු කළා "

(අ) මෙහි "ඇය" යනුවෙන් හැඳින්වූයේ කාට ද ?

(ආ) මෙම පාඨය ඇතුළත් පාඩමේ නම ලියන්න.

(ඇ) මෙය කා විසින් ප්‍රකාශ කරන ලද්දක් ද?

ii. " ඉඳා ඉක්මනට කඩේට ගිහිල්ලා , නූල් රෝද දෙකක් අරගෙන වරෙන් "

(අ) මෙම ප්‍රකාශය සඳහන් පාඩම කුමක් ද ?

(ආ) එම පාඩම ඇතුළත් කෙටි කතා සංග්‍රහය රචනා කළේ කවුද ?

(ඇ) මෙය කවුරුන් විසින් ප්‍රකාශ කරන ලද්දේ ද?

iii. " වහා තාගේ කඩුව හා දුනු හී බිම දමා මට නමස්කාර කරව "

(අ) මෙම පාඨය ඇතුළත් නාට්‍ය කුමක් ද ?

(ආ) එහි රචකයා කවු ද ?

(ඇ) මෙය කා හට ප්‍රකාශ කරන ලද්දක් ද ?

iv. " කොහොම හරි කියන්න හෙට උදේ ම එන්න කියල "

(අ) මෙය කවුරුන් විසින් ප්‍රකාශ කළේ ද ?

(ආ) කා හට ප්‍රකාශ කරන ලද්දේ ද ?

(ඇ) මෙම ප්‍රකාශය සඳහා ලැබුණු පිළිතුර කුමක් ද?

v.
ගත රැඳි දුහුවිලි රනබරණයි
දහඩිය මඩ විලවුන් සුවඳයි
රට වෙනුවෙන් ගත සිත වෙහෙසෙයි
.........................................................................

(අ) ඉහත ගීත කොටසේ අවසන් පේළිය සම්පූර්ණ කරන්න.

(ආ) මෙහි රචකයා නම් කරන්න.

(ඇ) "රනබරණ" යන්නෙහි අර්ථය ලියන්න.

(ලකුණු 15 යි)

03. පහත කවිය කියවා අසා ඇති ප්‍රශ්නවලට උත්තර සපයන්න.

අවුකන - ගල් වෙහෙර ඇත මහ පිළිම තැණූ
සුකිරි වගෙයි පුත්තලමේ මිදුණූ ලුණූ
සීගිරි ගලේ සිතුවම් ලොව පුදුම වුණූ
ආඩම්බරයි ලෝවා මහ පහයෙ කණූ

i. කවියේ සඳහන් පරිදි ලොව පුදුමයට පත් කරන කලා නිර්මාණය කුමක් ද ?

ii. මෙහි සඳහන් සංස්කෘතික උරුමයන් දෙකක් නම් කරන්න.

iii. කවියෙහි ඇතුළත් උපමාවක් උපුටා දක්වන්න.

iv. මෙහි ඇතුළත් නාම විශේෂණ පද දෙකක් ලියන්න.

v. පහත සඳහන් වචන සඳහා , කවියෙහි යෙදෙන සමාන පද උපුටා දක්වන්න.

(අ) ප්‍රතිමා (ආ) චිත්‍ර

(ලකුණු 10 යි)

04. සිරිපුර විජය මහා විද්‍යාලයේ පරිසර නියමු හට කණ්ඩායම විසින් පොලිතීන් භාවිතයෙන් වන හානි සහ විකල්ප ඇසුරුම් මාධ්‍ය භාවිතය පිළිබඳ වැඩමුළුවක් සංවිධානය කර ඇත. ඒ පිළිබඳ ප්‍රජාව දැනුවත් කරන දැන්වීම් පත්‍රිකාවක් සකස් කරන්න.

නැතහොත්

ඔබ ප්‍රදේශයේ මිණිමුතු ළමා සමාජයේ සාමාජිකත්වය ලබා ගැනීම සඳහා සුදුසු ජීව දත්ත පත්‍රිකාවක් පිළියෙල කරන්න.

(ලකුණු 15 යි)

## 2019 - දෙවන වාර පරීක්ෂණය - 08 ශ්‍රේණිය

### සිංහල භාෂාව හා සාහිත්‍යය I, II පත්‍ර - පිළිතුරු පත්‍රය

### I කොටස

| ප්‍රශ්න අංකය | පිළිතුර |
|---|---|
| 01 | 4 |
| 02 | 3 |
| 03 | 2 |
| 04 | 1 |
| 05 | 1 |
| 06 | 2 |
| 07 | 1 |
| 08 | 1 |
| 09 | 4 |
| 10 | 3 |
| 11 | 2 |
| 12 | 2 |
| 13 | 3 |
| 14 | 3 |
| 15 | 4 |
| 16 | 4 |
| 17 | 2 |
| 18 | 3 |
| 19 | 3 |
| 20 | 1 |

## II කොටස

01) රචනය

- සාරවත් බව - ලකුණු 07
- සංවිධානය, නිර්මාණාත්මකබව හා ස්වීයත්ව - ලකුණු 10
- ශිල්පීය දක්ෂතා - ලකුණු 03

20

02)

i. අ) කෘතිම නයිටිංගේල්
ආ) සැබෑ ලෙන්ගතුකම
ඇ) අධිරාජයා ( 3 x 1 = 3 )

ii. අ) අවුරුදු සිහිනය
ආ) ගුණදාස අමරසේකර මහතා
ඇ) ස්වාමි දුව ( 3 x 1 = 3 )

iii. අ) මනමේ නාට්‍යය
ආ) මහචාර්ය එදිරිවීර සරත්චන්ද්‍ර මහතා
ඇ) මනමේ කුමරුට ( 3 x 1 = 3 )

iv. අ) පියසේන
ආ) වේදිකාවේ සිටි මිනිසා
ඇ) ‘‘නෑ ඒවා ඔක්කොම හරි’’ ( 3 x 1 = 3 )

v. අ) සිත සතුටේ උල්පත එතැනයි
ආ) මහගමසේකර මහතා
ඇ) රත්‍රං ආභරණ ( 3 x 1 = 3 )

03)

i. සීගිරි චිත්‍ර / සීගිරි ගලේ සිතුවම්
ii. අව්කන පිළිමය , ගල්විහාරය , සීගිරිය , ලෝවාමහාපාය
iii. සුකිරි වගෙයි පුත්තලමේ මිදුණු ලුණු
iv. මහ පහයෙ/ මහ පිළිමු
v. අ) පිළිම ආ) සිතුවම්

( 2 x 5 = 10 )